ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 2023/2024
4 වන මට්ටම
අවසාන පරීක්ෂණය
LLU4708 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය II
කාලය පැය (03) තුනයි.

---

දිනය - 2025 මැයි 03 වේලාව - ප.ව. 01.30 – ප.ව.04.30

---

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.
ප්‍රශ්න ගණන **08** යි.
**<u>I සහ II වන කොටස් අතරින් එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් (02) තෝරා ගනිමින් ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>**

## I කොටස

1. "අපේක්ෂකයෙකු සහ තවත් අපේක්ෂකයෙකු අතරින් පුරවැසියන්ගේ මනාපය, නිහඬව සහ රහසිගතව ප්‍රකාශ කිරීම සිදු කරන ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස ක්‍රියාත්මක කිරීමකි."

Fennando J in *Thavaneethan v. Dayananda Dissanayake, Commissioner of Elections and others* [2003] 1 Sri. L.R 99

ශ්‍රී ලංකාවේ අධිකරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(අ) ව්‍යවස්ථාව පුළුල් කියවීමක් ලබා දීමේ ප්‍රගතිශීලී ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇත.
ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වන්නේ ද? අදාල විනිශ්චිත නඩු තීරණ සහ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන යොදා ගනිමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(අ) ව්‍යවස්ථාවේ අර්ථය අර්ථ නිරූපණය කිරීම සම්බන්ධ ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රවේශය කෙතරම් දුරට මෙම ප්‍රකාශය මගින් ප්‍රතිබිම්භනය කරන්නේ ද යන්න සාකච්ඡා කරන්න.

(20 Marks)

2. පහත දී ඇති නඩු තීන්දු අතරින් **දෙකක් (02)** තෝරා ගෙන සටහන් ලියන්න.

I. *සීමාසහිත පාරිසරික පදනම එදිරිව නාගරික සංවර්ධන අධිකාරිය සහ අනෙකුත් අය* [2009] 1 Sri.L.R.123
II. *රියන්සි පෙරේරා සහ තවත් අය එදිරිව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ තවත් අය* (1978-79-80) 1 Sri.L.R. 128
III. *වන්න පිරිස් සහ තවත් අය එදිරිව නීතිපති සහ තවත් අය (රටවැසි පෙරමුණ නඩුව)* [1994] 1 Sri.LR 1
IV. *අමරතුංග එදිරිව සිරිමල් සහ තවත් අය (ජන ඝෝෂා නඩුව)* [1993] 1 Sri L R 264

(10 x 2 = 20 Marks)

3. පහත සිද්ධිය 'සියරා' නම් රාජ්‍යයේ සිදුවූ අතර එහි නෛතික සහ ව්‍යවස්ථාපිත රාමුව ශ්‍රී ලංකාවට සමාන වේ.
නදී යනු ජනප්‍රිය සමාජ මාධ්‍ය ක්‍රියාකාරිනියක් සහ පොඩ්කාස්ට් (Podcast) ශිල්පිනියකි. ඇගේ යූ ටියුබ් නාලිකාව සමකාලීන සමාජ හා දේශපාලනික ගැටලු පිළිබඳ අදහස් අඩංගු වැඩිපුරම නරඹන නාලිකාවකි . ඇගේ මෑත කාලීන පොඩ්කාස්ට් කථාංගයක දී, ආගමික පදනම මත රාජ්‍ය ආයතනවල අනිවාර්ය ඇඳුම් පැළඳුම් කේත (Dress code) ක්‍රියාත්මක කිරීමේ රජයේ යෝජනාවක් ඇය විවේචනය කළාය. පොඩ්කාස්ට් කථාංගය අතරතුර, ඇය මෙසේ පැවසුවාය.

"රජය එක් ආගමක් මත පදනම් වූ ඇඳුම් පැළඳුම් කේත අනුගමනය කිරීමට මිනිසුන්ට බල නොකළ යුතුය. අපි අවංකව කතා කරන්නේ නම්, සමහර ආගමික නායකයින් පවා ඔවුන් කතා කරන වටිනාකම් සෑමවිටම අනුගමනය නොකරයි..."

මෙම කථාංගය ප්‍රචලිත වූ අතර ආගමික සංවිධාන කිහිපයකින්ම ප්‍රතිචාර ලැබුණි.ඇයගේ අදහස් නිසා ඔවුන්ගේ විශ්වාසයන්ට අපහාස වූ බව ඔවුහු පැවසූහ. දින කිහිපයකට පසු, පොලිස් නිලධාරීන් විසින් නදී ඇගේ නිවසේදී අත්අඩංගුවට ගන්නා ලදී. නීති උපදේශකයෙකු හෝ ඇගේ පවුලේ අය වෙත ප්‍රවේශය නොමැතිව ඇය දින තුනක් රඳවා තබා ගන්නා ලදී.

ඇය රඳවා තබා ගැනීමේදී, නීතිමය නියෝජනයක් නොමැතිව ඇයව නැවත නැවතත් ප්‍රශ්න කරමින්, නිසි ආහාර දීම ප්‍රතික්ෂේප කරමින්, සහ ඇගේ පෞද්ගලික විශ්වාසයන් පිළිබඳ කාන්තා නිලධාරීන් විසින් පහත් ලෙස සැලකීමට ලක් කරන ලදී. දින තුනකට පසු, ඇයව මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියට ඉදිරිපත් කරන ලද අතර, "ආගමික කණ්ඩායම් අතර අසමගිය ප්‍රවර්ධනය කිරීම" සම්බන්ධ නීති යටතේ චෝදනා එල්ල කරන ලදී.
ඇප මත මුදා හැරීමෙන් පසු, නදී පොලිසියේ හැසිරීම සහ ඇගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීමට බලාපොරොත්තු වෙයි.

ඔබ නදීගේ නීතිඥවරයා යැයි උපකල්පනය කරමින්, ඇයට ඉදිරිපත් කළ හැකි තර්ක පිළිබඳ සටහනක් සකස් කරන්න. සටහන සකස් කිරීමේදී, වගඋත්තරකරුට රඳා පැවතිය හැකි ප්‍රති තර්කයන් ද ඔබ සාකච්ඡා කළ යුතුය. අදාළ ව්‍යවස්ථාමය විධිවිධාන සහ නඩු තීරණ භාවිතා කරන්න.

(20 Marks)

4. ඔබ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ නීති පර්යේෂකයෙකු ලෙස පත් කර ඇතැයි උපකල්පනය කරන්න. ඔබේ පළමු පැවරුම වන්නේ ශ්‍රී ලංකා මානව හිමිකම් ක්ෂේත්‍රය යටතේ සමානාත්මතාවයට ඇති අයිතිය ක්‍රියාත්මක කිරීම ගැන සවිස්තරාත්මක විශ්ලේෂණ වාර්තාවක් සකස් කිරීමයි.

ඔබ දේශීය සහ අන්තර්ජාතික නීතිමය විධිවිධාන, නඩු නීති යන දෙකම භාවිතා කළ යුතුය.

(20 Marks)

## II කොටස

5. ඔබ ශ්‍රී ලංකාවේ බලය බෙදා හැරීමේ රාමුව සංවර්ධනය කිරීම සඳහා කටයුතු කරන රජයේ කොමිසමේ පර්යේෂණ කමිටුවක සාමාජිකයෙකු යැයි උපකල්පනය කරන්න. *දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ පළාත් සභා පනත් කෙටුම්පත* සම්බන්ධ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය (1987) 2 Sri. L.R. 312. හි නඩු විශ්ලේෂණ වාර්තාවක් සකස් කිරීමට ඔබට අවශ්‍ය වේ. ඔබ එහිදී බහුතර සහ සුළුතර විනිශ්චයන් දෙකම සාකච්ඡා කිරීමට අවශ්‍ය කරයි. ඊට අමතරව, පළාත් සභාවල විෂය පථය ගැන ශ්‍රේෂ්ඨාධිකරණයේ අර්ථ නිරූපණය බලය බෙදා හැරීමේ සංකල්පයේ පුළුල් ප්‍රවේශය සමඟ සමපාත වේද යන්න පිළිබඳව කොමිසම ඔබේ මතය විමසීමට බලාපොරොත්තු වෙයි.

(20 Marks)

6. පහත දක්වා ඇති මාතෘකා අතරින් ඕනෑම දෙකක් **(02)** පිළිබඳව සටහන් ලියන්න.

   I. බලය බෙදා හැරීමේ ලක්ෂණයන්
   II. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය සහ බහුතරවාදීත්වය
   III. ඒකීය ආණ්ඩුක්‍රමය සහ ෆෙඩරල් ආණ්ඩුක්‍රමය
   IV. ෆෙඩරල්වාදය සහ බලය බෙදා හැරීම අතර සංසන්දනය

(10 x 2 = 20 Marks)

7. ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් පළාත් සභාවලට යම් බලතල ලබා දී තිබුණද, සභාවලට එම බලතල භාවිතා කිරීම ව්‍යවස්ථාමය බාධා හේතුවෙන් සීමා වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, පළාත් සභා ක්‍රමය ශ්‍රී ලංකාවේ අකාර්යක්ෂම යාන්ත්‍රණයක් බවට පත්ව ඇත. එබැවින්, ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමයේ දුර්වලතා සහ ශක්තීන් තක්සේරු කිරීමට පළාත් පාලන අමාත්‍යාංශය තීරණය කර ඇත. එබැවින්, පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් "ශ්‍රී ලංකාවේ පළාත් සභා වල කාර්යක්ෂමතාව" පිළිබඳ වාර්තාවක් ලියන ලෙස අමාත්‍යාංශය ඔබෙන් ඉල්ලා සිටියි.

   අ) පළාත් සභාවේ ව්‍යවස්ථාදායක බලය
   ආ) පළාත් සභාවේ විධායක බලය
   ඇ) පළාත් සභාවේ අධිකරණ බලය

   අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු තීන්දු ඇසුරෙන් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(20 Marks)

8. "ව්‍යවස්ථාදායකයේ මෙන්ම ආණ්ඩුවේ අනෙකුත් ශාඛාවල සියලූ අත්තනෝමතික ක්‍රියාවලට එරෙහිව පුද්ගලයන්ගේ ආරක්ෂාවක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සැලකිය හැකිය."

Friedrich Hayek, The constitution of liberty, P.178

ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟද? ඉහත ප්‍රකාශය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදයේ න්‍යාය ඇසුරින් විශ්ලේෂණය කරන්න. ඔබේ පිළිතුරට සහාය දැක්වීම සඳහා ඔබ අදාළ නෛතික අධිකාරීන් වෙත යොමු විය යුතුය.

(20 Marks)